පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120
ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635
දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)
වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk
ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk

මගේ අංකය / எனது இலக்கம் / My NO — 382/2024
ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024
දිනය / திகதி / Date — 04/03/2024
පැය 1140

# මාධ්‍ය නිවේදනය

## පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු

**01. 2024.03.03 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 07 | 07 | 157 | - | යකඩ බැරල් 02<br>තඹ දඟර 02 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02. මත් කරල් සමඟ අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා උතුරු පලාත් විශේෂ වැටලීම් ඒකකය.**

2024.03.03 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා උතුරු පලාත් විශේෂ වැටලීම් ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මන්නාරම පොලිස් වසමේ පෙරියකරිසල් ප්‍රදේශයේ වැටලීමක් සිදු කර මත් කරල් 200 ක් සමඟ සැකකරුවකු අත්අඩංගුවට ගෙන මන්නාරම පොලිස් ස්ථානය වෙත භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41 ක් වූ මන්නාරම ප්‍රදේශයේ පදිංචිකරුවකු වේ.**

මන්නාරම පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. හෙරොයින් සමග සැකකරුවකු අත් අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා රත්ගම කඳවුර.**

2024.03.03 වන දින රත්ගම කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා රත්ගම කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත හික්කඩුව පොලිස් වසමේ දොඩංදූව ප්‍රදේශයේ වැටලීමක් සිදු කර හෙරොයින් ග්‍රෑම් 02 මිලි ග්‍රෑම් 151 ක් හා තහනම් පිහියක් සමඟ සැකකරුවෙකු අත් අඩංගුවට ගෙන හික්කඩුව පොලිස් ස්ථානය වෙත භාර දී ඇත

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වූ දොඩංදූව ප්‍රදේශයේ පදිංචිකරුවකු වේ.**

හික්කඩුව පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. අයිස් සමඟ සැකකරුවකු අත් අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ඌරගස්මංහන්දිය උප කඳවුර.**

2024.03.03 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ඌරගස්මංහන්දිය උප කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත ඌරගස්මංහන්දිය පොලිස් වසමේ තයිලැත්තැව ප්‍රදේශයේ වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 07 මිලි ග්‍රෑම් 890 ක්, කඩුවක් හා කිනිසි 01 සමඟ සැකකරුවෙකු අත් අඩංගුවට ගෙන හික්කඩුව පොලිස් ස්ථානය වෙත භාර දී ඇත

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක් වූ තයිලැත්තැව ප්‍රදේශයේ පදිංචිකරුවකු වේ.**

ඌරගස්මංහන්දිය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**05. බලපත්‍ර නොමැතිව ට්‍රැක්ටර් රථයකින් තේක්ක වර්ගයේ දැව කඳන් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා තංගල්ල කඳවුර.**

2024.03.03 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා තංගල්ල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වීරකැටිය පොලිස් වසමේ හිගුරුමුලන ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව ට්‍රැක්ටර් රථයකින් තේක්ක වර්ගයේ දැව කඳන් 41 ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වැඩිදුර විමර්ශන සඳහා වීරකැටිය පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 22 ක් වූ මැදමූලන ප්‍රදේශයේ පදිංචිකරුවකු වේ.**

වීරකැටිය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**06. ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කතරගම කඳවුර.**

2024.03.03 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා දඹුල්ල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත කතරගම පොලිස් වසමේ පුංචිදබේ ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර ගංජා කිලෝ 03 ග්‍රෑම් 170 ක් සමඟ කතරගම පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වූ සෙල්ලකතරගම ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.** කතරගම පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**07.** **ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කතරගම කඳවුර.**

2024.03.03 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කතරගම කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත කතරගම පොලිස් වසමේ පුංචිදඹේ ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර ගංජා කිලෝ 02 ග්‍රෑම් 600 ක් සමඟ කතරගම පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වූ බෙරලිහෙල ප්‍රදේශයේ පදිංචිකරුවකු වේ.** කතරගම පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**08.** **ගංජා හා විදේශීය රටක නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කතරගම කඳවුර.**

2024.03.03 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කතරගම කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත කතරගම පොලිස් වසමේ පුංචිදඹේ ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර ගංජා කිලෝ 02 ග්‍රෑම් 70 ක් විදේශීය රටක නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු කතරගම පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35 ක් වූ තණමල්විල ප්‍රදේශයේ පදිංචිකරුවකු වේ.** කතරගම පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**